# 8 ශුද්ධ වූ පාවුලු තුමා

1. ඔබේ අත් දිගු කරලා
   මගෙ අත් මත තියලා
   ජේසුනි මගෙ දෑත
   ඔබේ සේවෙට ගන්න

2. ඔබේ අත් දිගු කරලා
   මගෙ දෙපා මත තියලා
   ජේසුනි මගේ දෙපා
   ඔබේ සේවෙට ගන්න

3. ඔබේ අත් දිගු කරලා
   මගෙ නෙත් මත තියලා
   ජේසුනි මගෙ දෙනෙත
   ඔබේ සේවෙට ගන්න


8.1 රූපය - ශුද්ධ වූ පාවුලු තුමා

4. ඔබේ අත් දිගු කරලා
   මගෙ දෙතොලට තියලා
   ජේසුනි මගෙ වචන
   ඔබේ සේවෙට ගන්න

5. ඔබේ අත් දිගු කරලා
   මගෙ හිස මත තියලා
   ජේසුනි මගෙ නුවණ
   ඔබේ සේවෙට ගන්න

6. ඔබේ අත් දිගු කරලා
   මගෙ පපුවට තියලා
   ජේසුනි මගෙ හුස්ම
   ඔබේ සේවෙට ගන්න

දෙවියන් වහන්සේ විවිධ පුද්ගලයින්ට විවිධ කැඳවීම් දානය කරමින් දේව සැලැස්ම ක්‍රියාත්මක කරන සේක. එලෙස කැඳවීමක් ලද ශුද්ධ වූ පාවුලු තුමා (සාවුල්) ඉහත ගායනයේ සඳහන් ආකාරයට තම මුළු ජීවිතය ම දේව සේවය වෙනුවෙන් කැප කළේ ය. බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත් ව තාර්සස්හි උපත ලැබූ එතුමා තම පියාගේ රෝම පුරවැසිභාවය කරණ කොට ගෙන විශේෂ වරප්‍රසාදවලට හිමිකරුවකු විය. ජෙරුසලමේ ප්‍රධාන ගුරුවරයකු වූ "ගමාලියෙල්" යටතේ මෙතුමා අධ්‍යාපනය ලැබුවේ ය. ඔහුට ජුදා දහම, නීතිය හා ව්‍යවස්ථාව පිළිබඳ ව ගැඹුරු ඥානයක් තිබිණි. කැඳවීමට පෙර පාවුලු තුමා ජුදා දහමට බෙහෙවින් ඇලුම් කර, එය රැක ගැනීමට ක්‍රිස්තු අනුගාමිකයන්ට පීඩා කළේ ය. ශුද්ධ වූ ස්තේපන් තුමාට ගල්ගසා මරා දැමූ විට, සාවුල් ද සතුට ප්‍රකාශ කළ බව ක්‍රියා 8:1-3හි සඳහන් වේ. ඒ වන විට පාවුලු තුමා ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හඳුනා ගෙන තිබුණේ නැත.

දිනක්, නායක පූජකයන්ගෙන් අවසර පතක් ලබා ගෙන ඔහු "දමස්කස්" නගරය කරා ගියේ කිතුනුවන් අත්අඩංගුවට ගැනීමට ය. ඒ යන අතර මග බලාපොරොත්තු නොවූ ආලෝකයක් එල්ල වීමෙන් ඔහු බිම ඇද වැටිණි. නැවත නැගිටින විට පාවුලු තුමාගේ දෑස් අන්ධ වී තිබිණි. එවිට උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ඔහුට කථා කරමින් ජීවිත වෙනසකට ඔහු යොමු කළ සේක. දමස්කස් නගරයේ සිටි "අනනියස්" මගින් සාවුල්ට ප්‍රසාද ස්නාපනය දෙන ලදුව, පෙනීම ලැබී ය (ක්‍රියා 9:1-19). එතැන් සිට දේව අනාවරණයට නතු වූ පාවුලු තුමා, අසහාය ධර්මදූතයකු විය. ශුද්ධ වූ සභාව පැතිර වීමට සුළු ආසියාවේ සිට



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ග්‍රීසිය හා රෝමය දක්වා ගමන් කර, දුෂ්කර සේවාවක නිරත වී "අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා" යන ගෞරව නාමය ලැබී ය.

ධර්මදූත චාරිකාවල දී නොයෙකුත් බාධා අභියෝග හා දුක්කම්කටොළුවලට එතුමාට මුහුණ දීමට සිදු විය. සිරකරනු ලැබීම ගල්ගසා නගරයෙන් පිටතට ඇද දැමීම ජුදයන්ගේ විරෝධයනට ලක්වීම ආදියේ දී පාවුලු තුමා ශුද්ධාත්මයාණන්ගේ මග පෙන්වීම තුළ සියල්ලට ම මුහුණ දී ඒවා ජය ගත්තේ ය. කිසි ම අවස්ථාවක දී පාවුලු තුමා පසුබට වූයේ නැත.

ශුද්ධ වූ පාවුලු තුමා ස්ථාපිත කළ සභාවන්හි විවිධ ගැටලු නිරාකරණය කිරීමට, කිතුනු ඇදහිල්ල හා යුතුකම් පෙන්වා දීමට, ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය පවත්වා ගැනීමට, ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය පිළිබඳ ගැටලුවලට පිළිතුරු දීමට "සංදේශ" ලියා යවන ලදි.

## ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත චාරිකා

### පළමුවන ධර්ම දූත ගමන




(ක්‍රියා 13:4-14:28)

ක්‍රි.ව 47 දී පමණ ශුද්ධ වූ පාවුලු තුමා සමග බර්ණබස් තුමා හා ජොහන් මාක් තුමා මෙම ගමනට සහභාගි විය.

සිරියාවේ අන්තියෝකිය → සිලුකිය → සලමිසය → පාපස් → පර්ගා

පිසිදියේ අන්තියෝකිය → ඉකෝනිය → ලුස්ත්‍රාව → දර්බය

මේ සැම නගරයකට ම ගොස් දේශනා කරමින් කිතුනු සංඝ ස්ථාපිත කර, නායකයන් පත් කළේ ය.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## දෙවන ධර්ම දූත ගමන




(ක්‍රියා 15:36-18:23)

ක්‍රි.ව. 50-52 අතර පාවුලු තුමා සීලස් සමග මෙම චාරිකාව අරඹයි. පසු ව තිමෝතියස් තුමා හා ලූක් තුමා ද මෙයට එක් විය.

සිරියාවේ අන්තියෝකිය → තාර්සස් → දර්බය → ලුස්ත්‍රාව → ඉකෝනිය → පිසීදියේ අන්තියෝකිය → ත්‍රෝවසය → පිලිප්පිය → තෙසලෝනිකය → බෙරියාව → ඇතැන්ස් → කොරින්තිය → එපීසය → ජෙරුසලම

## තුන්වන ධර්ම දූත ගමන



(ක්‍රියා 18:24-21:17) ක්‍රි.ව. 53-57 අතර

සිරියාවේ අන්තියෝකය → දර්බය → ලුස්ත්‍රාව → ඉකෝනිය → එපීසය → මසිදෝනිය → ග්‍රීසිය → ත්‍රෝවසය → මිලේතසය → එපීසය → ජෙරුසලම

## ශු. පාවුලු තුමාගේ ජීවිතයේ අවසාන කාලය

තුන්වන ධර්මදූත චාරිකාවෙන් පසු පාවුලු තුමා ජෙරුසලම් නගරයේ නැවතී සිටියේ ය. ආසියාවෙන් පැමිණ සිටි ජුදෙව්වරුන් කළ චෝදනා මත එතුමා දේව මාළිගයේ දී අත්අඩංගුවට ගත්තේ ය. ජේසුස් වහන්සේ මෙන් ම පාවුලු තුමා ද කිහිප දෙනකුගේ විනිශ්චයට ලක්විය. අවසානයේ රෝමයේ සුබාරංචිය දේශනා කිරීමේ අරමුණින් පාවුලු තුමා තම රෝම පුරවැසිභාවය පදනම් කර ගෙන රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලූ නිසා ඔහු ව සිරකරුවකු සේ රෝමයට ගෙන යන ලදි. තම රෝම ගමනේ ප්‍රතිඵල නෙලා ගනිමින් පාවුලු තුමා රෝමයේ නිවාස අඩස්සියේ සිටිය දී ශුභ අස්න නොඅසා සිටි රෝමයේ ජනතාවට ධර්මය දේශනා කළේ ය.

ශුද්ධ වූ පාවුලු තුමා රෝම අධිරාජ්‍යය පුරා ම කිතුනු දහම ව්‍යාප්ත කළේ ය. පැමිණි සියලු පීඩාවන්ට හා අභියෝගයන්ට මුහුණ දී ජය ගත්තේ ය. අවසානයේ රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී (ක්‍රි.ව. 68) හිස ගසා මරා දමනු ලැබිණි.

### ක්‍රියාකාරකම

1. ශු. පාවුලු තුමා පිළිබඳ රචනයක් ලියන්න.
2. ශ්‍රී ලංකාවේ දහම් සේවයේ නියුතු විශ්වාසිකයනට, ශුද්ධ වූ පාවුලු තුමාගෙන් ලබා ගත හැකි ආදර්ශ **තුනක්** ලියන්න.

*ජීවිතය සඳහා*

*පැවරෙන ඉතා සුළු කාර්ය පවා සැලකිල්ලෙන් හා අවධානයෙන් ඉටු කරමු.*